රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
ඉංජිනේරු සේවා අංශය, பொறியியல் சேவைப் பிரிவு, Engineering Services Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.
Website : www.pubad.gov.lk

දුරකතන / தொலைபேசி / Telephone } 011-2696211-13
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No } MPA/ESD/14/01/07/2023
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2023.12.04

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම් / උසස් කිරීම්වලට අදාළව සේවා ව්‍යවස්ථාවල සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල වලංගුභාවය තහවුරු කර ගැනීම - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය**

සේවා ව්‍යවස්ථාවල සඳහන් පත්කිරීම් / උසස් කිරීම්වලදී සුදුසුකම් සනාථ කිරීම සඳහා නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික, අදාල තනතුරේ පරිපාලන බලධාරීත්වය දරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් එම සහතික නිකුත් කරන ලද ආයතනයෙන්ම සනාථ කර ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවට එම කොමිෂන් සභාව තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/HB/26/2023 හා 2023.08.25 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

02. ඒ අනුව, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියේ 2023.07.01 දිනට පවතින පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන නිලධරයන් තම පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික පත්‍ර හා ඒවායේ විස්තරාත්මක ප්‍රතිඵල සටහන්වල සහතික කළ පිටපත් අදාල ආයතන මගින් සනාථ කර ගැනීම සඳහා **2023.12.15 දිනට පෙරද,** දැනට පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති අනෙකුත් නිලධරයන් තම පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික පත්‍ර හා ඒවායේ විස්තරාත්මක ප්‍රතිඵල සටහන්වල සහතික කළ පිටපත් එකී ආයතන මගින් සනාථ කර ගැනීම සඳහා **2023.12.31 දිනට පෙරද** පහත ලිපිනය වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. තවදුරටත් පශ්චාත් උපාධි / පශ්චාත්උපාධි ඩිප්ලෝමා හදාරමින් සිටින නිලධරයන් අදාල අධ්‍යයන කටයුතු අවසන් වූ පසු එකී සහතික පත්‍රවල සහතික කළ පිටපත් සනාථ කරගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව අවධාරණය කරමි.

ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ
ඉංජිනේරු සේවා අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

03. තවද, මෙම පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සනාථ කරගත් පමණින් එය සේවා ව්‍යවස්ථාවේ සඳහන් උසස්වීම් සඳහා සම්පූර්ණ කළ යුතු පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව විෂයය ක්ෂේත්‍රයන්ට අදාල වන බව ඉන් අදහස් නොවේ. ඒ අනුව නිලධරයෙකු තමා විසින් සම්පූර්ණ කළ පශ්චාත් උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ "10.3.1 (v) ආ" හි දක්වා ඇති පරිදි මාස 09 කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි

ඩිප්ලෝමාවක් හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ / කළමනාකරණ ක්ෂේත්‍රයේ / තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පමණක් මේ සඳහා අදාල වේ.

04. තම එකම පශ්චාත් උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව විදේශ විශ්වවිද්‍යාලයකින් ලබා ගත් නිලධරයන් හෝ හැදෑරූ පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා අතුරෙන් සේවා ව්‍යවස්ථාවට අදාලත්වයක් පවතින්නේ විදේශ විශ්වවිද්‍යාලයකින් හැදෑරූ පශ්චාත් උපාධියක / පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක පමණක් නම්, එම නිලධරයන් තම පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සනාථ කරගැනීමේ කටයුතු සඳහා ඉදිරිපත් කරන සහතිකපත්‍රවල සහතික කළ පිටපත්වලට අමතරව අදාල විශ්වවිද්‍යාල පරිපාලනය අමතමින් සකස් කරන ලද ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. (එහි ආකෘතිය ඇමුණුම I පරිදි වේ.)

05. විදේශ විශ්වවිද්‍යාලවලින් ලබා ගත් පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා අදාළ විදේශ විශ්වවිද්‍යාල වෙත හෝ උසස් අධ්‍යාපන ආයතන වෙත යොමු කර සනාථ කරගත යුතු බැවින් ඒ සඳහා යම් මුදල් අයකිරීමක් සිදුවන්නේ නම් එම මුදල ගෙවිය යුතු ආකාරය පිළිබඳ අදාළ නිලධාරීන් ඉදිරියේදී දැනුවත් කෙරෙනු ඇත.

**පී.ඩබ්ලිව්. රාජපක්ෂ**
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකථන / ෆැක්ස් : 0112 698268
විද්‍යුත් තැපැල් ලිපිනය : esbpubad@gmail.com

<u>**Annexure I**</u>

## <u>Sample Letter</u>

(Your Name)
(Address)
(Today's Date)

(Name of Recipient)
(Title)
(Address)

Dear Sir/Madam,

**Verification of Authenticity of Foreign University Degree Certificate of Mr./Ms. …………….. from University of ……………………………………….**

I do hereby authorize the High Commission of Sri Lanka in ……………………. through Foreign Ministry in Sri Lanka to obtain the verification of authenticity of my degree certificate received from the University of ……………………………. (with country)

Thank You.
…………………………………………
Mobile No.: ……………………………

Purpose: Please note that degree certificate is needed for (mention the purpose of getting degree verification)